## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3325 යටතේ මම තීරණය කරමි. එනම් :

2025 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1659 හා 2010.06.18 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2017 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2025 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමටත්

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද සමාන වාරික හතරකින් අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්,

එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද අලව්ව ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

#### උපලේඛනය

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2025.03.31 | 2025.01.31 |
| දෙවන කාර්තුව | 2025.06.30 | 2025.04.30 |
| තුන්වන කාර්තුව | 2025.09.30 | 2025.07.31 |
| හතරවන කාර්තුව | 2025.12.31 | 2025.10.31 |

08 - 21/2